මගේ අංකය :- කේ 08/විවිධ/2013.
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2013-03-18 වන දින.

චක්‍රලේඛ අංකය :- 16 /2013

සියළුම බන්ධනාගාර අධිකාරීන්
සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

## සිරකරුවන් උපයා ගත් මුදලින් දඩ මුදල් ගෙවීම සම්බන්ධව

සිරකරුවන් දෛනිකව සේවය කර ඔවුන් විසින් උපයාගත් මුදලින් අධිකරණයට යම් කිසි දඩ මුදලක් ගෙවීමට නියම කර ඇත්නම් එම දඩ මුදල් තම ඉපයීම් වලින් ගෙවීමට හැකි බව සිරකරුවන් දැනුවත් කල යුතුය.(සුභසාධක අංශය මගින්)

02. දෛනිකව උපයා ගත් මුදලින් අධිකරණය මගින් නියම කරල ලද දඩ මුදල ගෙවීමට කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීමක් කල අවස්ථාවකදී සිරගොනුවේ සටහන් කර අධිකාරි අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

03. තම ඉපයීම් වලින් දඩ මුදල් ගෙවීමට විරුද්ධතාවයක් නොමැති බවට සිරකරුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කල යුතුය

04.සිරකරුගේ ඉපයීම් මුදල් තැන්පත් කර ඇති බැංකුවේ මුදල් පත්‍රිකා පුරවා සම්පූර්ණ කර සිරකරුගේ අත්සන සහිතව සහ අධිකාරීවරයාගේ ඉල්ලීම් ලිපියක් සමග අදාල බැංකුව වෙත ඉල්ලීමක් කර මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

05. බැංකුව මගින් ලබා ගත් මුදල් දඬුවම් කල අධිකරණයට (දඩ මුදල් ගෙවීමට ඇති) ආසන්නතම බන්ධනාගාරයේ අධිකාරීවරයා වෙත යොමුකර එමගින් එම ආයතනයේ සුභසාධක නිලධාරියාවරයකු විසින් හෝ අදාල අධිකරණ කටයුතු සඳහා සේවයේ යොදවන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියකු භාරයේ එම මුදල් අදාල අධිකරණය වෙත ගෙවා කුවිතාන්සිය සිරකරු රඳවා සිටින බන්ධනාගාරය වෙත යැවීමට කටයුතු කල යුතුය.

06. එම දඩ මුදල් ගෙවීමෙන් පසු නිදහස් කරන ලද සිරකරුවන්ගේ විස්තර ඇතුලත් වාර්තාවක් සිරකරු නිදහස් කල බන්ධනාගාර අධිකාරීවරයා විසින් බන්ධනාගාර මූලස්ථානයේ සංඛ්‍යාලේඛණ අංශය වෙත සහ කේ අංශය වෙත සෑම මසකම අවසානයේ එවීමට කටයුතු කරන ලෙසට දන්වා සිටිමි.

පී.ඩබ්ලිව් කොඩිප්පිලි.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.